# ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණ පිළිබඳ විමර්ශනයක්

මධුසංක සඳනුවන් චන්දික කුලරත්න[2]


## සංක්ෂේපය

අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාව කෘෂිකාර්මික ආර්ථික ව්‍යුහයක් තුළින් ගොඩනැගෙන්නාවූ රාජ්‍යයක් වන අතර කෘෂිකාර්මික ජන සමාජය තුළ දරු සම්පත අගය කළ අතර එය ආර්ථික වශයෙන් වටිනා සම්පතක් ලෙස සළකන ලදි. මේ තත්ත්වය සමඟ ක්‍රමයෙන් වර්ධනය වූ ළමා ජනගහනය සම්බන්ධව ශ්‍රී ලංකාව තුළ නීති, අණපනත් සහ ප්‍රඥප්ති ආදිය තුළින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට සහ ප්‍රවර්ධනයට යාන්ත්‍රණයන් ස්ථාපිත කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා රජය විසින් ස්ථාපිත කර ඇති ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය සහ ඒවායේ ක්‍රියාකාරිත්වයේ ප්‍රමාණාත්මකභාවය සොයා බලා ප්‍රවර්ධනය විය යුතු අංශ හඳුනා ගනිමින් ඒ පිළිබඳ පර්යේෂණාත්මක අදහසක් සමාජ ගත කිරීම මෙම ලිපියේ මූලික අරමුණයි. ලිපිය සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කර ගැනීමේදී ද්විතියික දත්ත උපයෝගි කර ගත් අතර විශ්ලේෂණය සිදු කරනු ලැබුවේ විස්තරාත්මක ක්‍රමවේදය උපයෝගී කරගනිමිනි. මෙම ලිපියේ අවසාන නිගමනය වන්නේ, ශ්‍රී ලංකා රජය විසින් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය සඳහා නීති, අණපනත් සහ ප්‍රඥප්ති ස්ථාපිත කොට ඇති නමුත් ඒ තුළින් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී ඇතිවන්නා වූ ප්‍රායෝගික බාධාවන් නිසා මේවා හුදෙක් නීති, ප්‍රඥප්ති සහ ප්‍රතිපත්තිවලට පමණක් සීමා වී ඇති බවයි.


**මූඛ්‍ය පදඃ** *ළමා අයිතිවාසිකම්, කෘෂිකාර්මික, ආර්ථිකය, ජන සමාජය*

## හැඳින්වීම

ශ්‍රී ලංකාව  බහු වාර්ගික, බහු භාෂා සහ බහු ආගමික රාජ්‍යයක් වන අතර ජන සංඛ්‍යාව 20,359,439 කි (ජන හා නිවාස සංගණන වාර්තාව, 2012ඃ 37). මෙම ජන සංඛ්‍යාවෙන්  සියයට 74.9 ක් සිංහල ද, සියයට 15.4 ක් දෙමළ ද, සියයට 9.2 ක් මුස්ලිම් ද සහ වෙනත් ජනවර්ග සියයට 0.5 ක් වාසය කරන බවට එම වාර්තාව තුළින් තවදුරටත් පෙන්වා දී තිබේ (ජන හා නිවාස සංගණන වාර්තාව, 2012ඃ 127). ශ්‍රී ලංකාවේ සමස්ත ජන සංඛ්‍යාවෙන් ළමා ජනගහනය සියයට 33.4කි (ජන හා නිවාස සංගණන වාර්තාව, 2012ඃ 53). අතීතයේ සම්ප්‍රදායික උරුමයන් තුළින් බිහිවූ කෘෂිකාර්මික ජීවන රටාව මුල් කර ගනිමින් ඇතිවූ ආර්ථික රටාවත්, සෞඛ්‍යය හා සනීපාරක්ෂණ ප්‍රතිශක්තිකරණ ක්ෂේත්‍රයේ වර්ධනයත් සහ බටහිර වෛද්‍ය විද්‍යාවේ ආගමනය සමඟ ළමා ජනගහනය ක්‍රමයෙන් ශ්‍රී ලංකාව තුළ වර්ධනය වීම සිදු විය. ඒ සමඟ ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යුහය තුළ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පදනම් කරගනිමින් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණ ස්ථාපිත වීම සිදු වේ. මේ අනුව නීති, අණපනත් සහ ප්‍රඥප්ති ආදිය තුළින් ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යුහය තුළ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට විධිමත් යාන්ත්‍රණයක් ගොඩනගා තිබෙන අතර දේශීය හා විදේශීය වශයෙන් රාජ්‍ය නොවන සංවිධාන මෙන් ම, ජාත්‍යන්තර වශයෙන් ද, ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට සහ ප්‍රවර්ධනයට ඉඩ සලසා තිබේ. මෙසේ ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යාන්ත්‍රණ ගොඩනගා තිබුණත් ඒවා කොතරම් දුරට ප්‍රමාණවත් ද, යන ගැටලුව පවතී. ඒ අනුව මෙම යාන්ත්‍රණවල සංවර්ධනය විය යුතු තත්ත්වයන්  පෙන්වා දී ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුමක් ලබා දීම මෙම ලිපිය තුළින් අරමුණු කරගෙන තිබේ. ඒ අනුව ළමයා යනු කවරෙක් ද යන්න හඳුන්වාදීමත්, ළමා අයිතිවාසිකම් පිළිබඳවත් සහ එම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඇති යාන්ත්‍රණ පිළිබඳවත් මෙම ලිපිය තුළින් වැඩි දුරටත් සාකච්ඡා කෙරේ.

[2] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා (විශේෂ)  තෙවන වසර

## ළමයා යනු කවරෙක්දැ'යි හඳුනා ගැනීම

සමාජය නමැති දේහයේ න්‍යෂ්ටිය ළමා පරපුර වේ. ලෝකය ගොඩනැඟෙන්නේ අද කුඩා කළ සිට ජීව විද්‍යාත්මක වශයෙන් වර්ධනය වන්නා වූ ළමයින්ගෙනි. ඒ අනුව ළමයා යනු කවරෙක් ද, යන්න පිළිබඳ පැහැදිලි වූ නිර්වචනයක් නොමැත. විවිධ නිර්වචන තුළ ළමයා විවිධාකාරයෙන් අර්ථකථනය කිරීම නිසා එම නිර්වචන තුළ ව්‍යාකූලභාවයක් පවතී. කෙසේ වෙතත් වයස නිර්ණායකයක් කර ගනිමින් ළමයා යන්න නිර්වචනය කෙරේ (ඒකනායක, 1998: 18). ඒ අනුව 1989 නොවැම්බර් 20 වෙනිදා එක්සත් ජාතීන්ගේ මහ සම්මේලනයට ඉදිරිපත් කර 1990 සැප්තැම්බර් 02 වෙනිදා බලාත්මක වූ එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තියේ පළමුවන වගන්තියේ ළමයා පිළිබඳ නිර්වචනය කෙරේ. "වයස අවුරුදු 18 ට අඩු ඕනෑම අයෙකු ළමයෙකි" (වන්නිආරච්චි, 2003: 22). එසේම ජීව විද්‍යාත්මක අර්ථකථනයෙන් "ළමයා යනු උපතේ සිට වැඩිවිය පැමිණීම දක්වා කාලය තුළ පසුවන ජීවියාය" (ඒකනායක, 1998: 18). ඇමරිකානු සංක්‍රමණ නීතියට අනුව "අවුරුදු 20 කට අඩු ඕනෑම අයෙකු ළමයෙකු බවයි" (සිතුවම සංවර්ධන අධ්‍යාපන හා පුහුණු සංවිධානය, 2000: 12). ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය තුළ "වයස අවුරුදු අඩු ඕනෑම අයෙකු ළමයෙකු බවයි" එසේම දණ්ඩ නීති සංග්‍රහය තුළ ළමයා යන්න නිර්වචනයට 8, 10, 12, 14 සහ 16 යන විවිධ වයස් මට්ටම් දක්වා තිබේ. (සිතුවම සංවර්ධන අධ්‍යාපන හා පුහුණු සංවිධාන වාර්තාව, 2000: 13).

## ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම්

ළමයෙකුට ළමා වියේ දී ඉටු විය යුතු යුතුකම් ළමා අයිතිවාසිකම් ලෙස හඳුනා ගත හැකිය. මෙසේ ළමා පරපුර වෙත අයිතිවාසිකම් හිමි වීමේ දී, ඒ සමඟම ඔවුන්ට මුළු මහත් විශ්වයටම ඉටු කළ යුතු වගකීම් ද, වේ. එම නිසා ළමා අයිතිවාසිකම් ආරක්‍ෂා වීම තුළ දී, ළමයින් ද, ඊට අනුරූපීව තම වගකීම් ඉටු කළ යුතු වේ (කරුණාතිස්ස, 2000: 24). ඒ අනුව ළමා අයිතිවාසිකම් සම්බන්ධව සමස්ත ලෝකයටම පුර්වාදර්ශයන් ලැබුණේ 1989 නොවැම්බර් මස 20 වෙනිදා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සම්මත කිරීමෙන් අනතුරුව 1990 සැප්තැම්බර් 02 වෙනිදා සිට ක්‍රියාත්මක කළ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය තුළිනි (වන්නිආරච්චි, 2003: 24). මේ වන විට මෙම ප්‍රඥප්තියට රටවල් 190 ක් අත්සන් තබා තිබේ. ශ්‍රී ලංකාව මේ සඳහා 1991 ජූලි 12 අත්සන් තැබූ අතර ඇමරිකා එක්සත් ජනපදය හා සෝමාලියාව හැර අනෙකුත් සෑම සාමාජික රටක් ම, මෙයට අත්සන් තබා තිබේ (සමරකෝන්, 2007: 32). මෙම ප්‍රඥප්තියට අත්සන් කිරීමෙන් පසු එහි සාමාජික රටවල් එම නීති ක්‍රියාත්මක කිරීමට විවිධ ව්‍යාපෘති දියත් කරන අතර එම ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙලවලට අදාළ ව්‍යාපෘති වාර්තා ජිනීවා කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. මෙම ජිනීවා කමිටුව රටවල් 10 කින් සමන්විත අධීක්‍ෂණ කමිටුවකි (වන්නිආරච්චි, 2003: 24). කෙසේ නමුත් විශ්ව ව්‍යාප්ත මට්ටමින් නීති සහ ප්‍රඥප්ති සම්පාදනය කළ ද ලොව බොහෝ දියුණු හා දියුණු වෙමින් පවතින රටවල ළමා හිංසන, ළමා අපයෝජන, මෙහෙකාර සේවය, ළමා ගණිකා වෘත්තිය ආදිය ක්‍රියාත්මකවීම වර්තමානයේ පවතින ගැටලුවකි.

ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තියට අත්සන් තැබීමෙන් පසු දේශීය ලෙස ක්‍රියාවේ යෙදවීමට ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියක් සම්පාදනය කරන ලදි. මෙම ප්‍රඥප්තිය මගින් ළමයින්ගේ ආරක්‍ෂාව සහ අනාගත අභිවෘද්ධිය මූලික කර ගනිමින් ක්‍රියාත්මකවීමට ප්‍රතිපත්ති මාලාවක් හඳුන්වා දී, තිබේ. ඒ අනුව 1992 සැප්තැම්බර් මස 08 වෙනිදා ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය නීතිගත කරමින් ක්‍රියාත්මක කරන ලදි (කරුණාතිස්ස, 2000: 35). එසේම ව්‍යවස්ථාදායකය ද, ළමා අයිතිවාසිකම් වෙනුවෙන් විවිධ නීති සහ අණපනත් පනවා තිබේ. ඒ අතර 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත පෙන්වාදිය හැකිය. ළමා අපචාර සඳහා ලබා දෙන උපරිම හා අවම දඬුවම් මේ තුළ විග්‍රහ කර ඇත. එසේම 1998 අංක 27 දරණ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත තුළින් ස්ත්‍රී දූෂණය හෙවත් වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකු දූෂණය කිරීමේ නඩු හා සම්බන්ධ මූලික සාක්ෂි විභාගයේ අවශ්‍යතාව අවම කර තිබේ (මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිවේදි සංවිධානය, 2000: 10). එසේම 1998 අංක 28 දරණ අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය (සංශෝධන) පනත අනුව ළමා අපචාර නඩු සම්බන්ධව වැඩි බලතල ප්‍රමාණයක් පොලීසියට පැවරෙන අතර නඩු කාල සීමාව තුළ අපචාරයට පත් වූ ළමුන් ආරක්ෂිතව රඳවා තබා

ගැනීමට අවශ්‍ය වාතාවරණය මෙහිදි සපයා දීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබේ (මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිවේදි සංවිධානය, 2000: 11).

එමෙන්ම 1998 අංක 29 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත මගින් මාධ්‍යයවේදීන්ට ලැබෙන ළමුන් සම්බන්ධව අසභ්‍ය වාර්තා සම්බන්ධව තොරතුරු පොලීසියට දැනුම් දීම අත්‍යවශ්‍ය වේ. මෙහිදි මෙයට අදාළ සිදුවන වරදකදි වරදේ ප්‍රමාණයට අදාල නීතිමය පියවර ගනු ලැබේ. 2005 අංක 30 දරණ වෛශ්‍ය වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම පිළිබඳ පනත මගින් ළමයින් ගණිකා වෘත්තියේ යෙදවීමට අදාළව ගත හැකි නීතිමය පියවර අවධාරණය කොට තිබේ. මෙය 2002 ජනවාරි මස දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානය හරහා නේපාලයේ කත්මන්ඩු නුවර ඇති කර ගත් ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස ඉදිරියට පැමිණි දෙයකි (සමරකෝන්, 2007: 27). 1998 අංක 50 දරණ ජාතික ළමාරක්ෂණ අධිකාරී පනත ද, ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් සම්බන්ධව වැදගත් වූ තවත් පියවරක් වශයෙන් හඳුනා ගත හැක. මෙම පනත මගින් ජාතික ළමාරක්ෂණ අධිකාරිය ස්ථාපිත කරන ලදි. ළමා අපයෝජන පිළිබඳ විමර්ශනය කිරීම හා නීති සංශෝධනය, උපදෙස් සැපයීම, පර්යේෂණ සිදු කිරීම, නීති සහය ලබා දීම, ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් දැනුවත් කිරීම සහ 1929 ළමා අපයෝජන පිළිබඳ ක්ෂණික දුරකථන සේවාව පවත්වා ගෙන යාම ආදී කාර්යයන් ඒ අතර වේ. (ජාතික ළමාරක්ෂණ අධිකාරි වාර්ෂික වාර්තාව, 2013: 48).

එසේම පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තුමේන්තුව ද, ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන තවත් එක් පියවරකි. මෙමගින් ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාවේ යොදවමින් ඊට අදාළව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු වේ. ඒ අනුව පාසැල් නොයන ළමුන් පාසල් ගත කිරීම, විවිධ කැපකරු ශිෂ්‍යත්ව සහ ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ප්‍රාදේශීය කමිටු හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම, පරිවාස භාරයට පත් වූ ළමයින් නැවත සමාජ ගත කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙල සැකසීම, පර්යේෂණ සහ සමීක්ෂණ සිදු කිරීම, පුහුණු වැඩසටහන් දියත් කිරීම, ළමා මිතුරු ගම්මාන සහ ළමා නිවාස සඳහා අදාළ සේවා ලබා දීම ආදී කාර්යභාර්ය ඉටු කරයි (පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තුමේන්තුව කාර්යය සාධන වාර්තාව, 2014: 56). එමෙන්ම ළමා ලේකම් කාර්යාලය ද, මුල් ළමා විය සංවර්ධනයට අදාළ කටයුතු රැසක් ඉටු කරයි. ඒ අතර පෙර පාසල් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම, පෙර පාසැල් දරුවන්ට නැවුම් කිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, මුල් ළමා විය රැකවරණ මධ්‍යස්ථාන සහ මුල් ළමා විය සංවර්ධන ආදර්ශ ගම්මාන සඳහා අවශ්‍ය වැඩ පිළිවෙලවල් යනාදිය ක්‍රියාත්මක කරයි (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යංශ වාර්ෂික වාර්තාව, 2015: 54). එසේම පොලිස් කාන්තා සහ ළමා කර්යංශය ද, ළමා අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධව ක්‍රියාත්මක වන අතර එය දිවයිනේ පවතින ප්‍රාදේශීය පොලිස් ස්ථානවල එම කාර්යංශය ප්‍රාදේශීය වශයෙන් ළමා අයිතිවාසිකම් කඩ වීම සම්බන්ධව ක්‍රියාත්මක වීමට පිහිටුවා තිබේ (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යංශ පොලිස් ළමා හා කාන්තා කාර්යංශ නගා සිටු වීමේ වාර්ෂික වාර්තාව, 2014: 03). මීට අමතරව පොලිස් කාන්තා සහ ළමා කාර්යංශය සහ ජාතික ළමාරක්ෂණ අධිකාරිය හරහා විවිධ ආයතන හා පුද්ගලයන්ගෙන් නාමිකව සහ නිර්නාමිකව ලැබෙන ළමා සේවක පැමිණිලි විභාග කර බැලීම සහ එම සේවායෝජකයන්ට විරුද්ධව නීතිමය කටයුතු සිදු කිරීම ආදිය තුළින් ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පියවර ගනු ලැබේ (කම්කරු දෙපාර්තුමේන්තුව: කාන්තා හා ළමා කටයුතු අංශය වාර්ෂික වාර්තාව, 2012: 58). ඒ අනුව ශ්‍රී ලංකාව තුළ මෙවැනි නීති හා යාන්ත්‍රණ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් ස්ථාපිත වූයේ ක්‍රමිකව ළමා ජනගහනයේ ඇති වූ වර්ධනයට සාපේක්ෂව ඔවුන්ගේ පැවැත්ම සහ රැකවරණය සම්බන්ධ අයිතිවාසිකම් නිර්මාණය වීම සමඟය. වයස් කාණ්ඩ අනුව 1946 සිට 2012 වර්ෂය දක්වා වයස් කාණ්ඩ අනුව ළමා ජනගහනයේ ස්වභාවය පහත වගු සටහන 01 පරිදි වේ.

වගු අංක 01: 1946 සිට 2012 වර්ෂය දක්වා වයස් කාණ්ඩ අනුව ළමා ජනගහනයේ වර්ධනය

| වයස් කාණ්ඩ | 1946 | 1953 | 1963 | 1971 | 1981 | 2001 | 2012 |
|---|---|---|---|---|---|---|---|
| 00-04 | 12.9% | 14.9% | 15.2% | 13.1% | 12.5% | 8.5% | 8.6% |
| 05-09 | 12.2% | 13.4% | 13.7% | 13.2% | 11.3% | 8.8% | 8.6% |
| 10-14 | 12.1% | 11.4% | 12.6% | 12.7% | 11.4% | 9.0% | 8.1% |
| 15-19 | 10.2% | 8.7% | 9.7% | 10.7% | 10.8% | 9.7% | 8.1% |

මූලාශ්‍රය: ජන හා හා නිවාස සංගණන වාර්තාව, 2012

මෙලෙස වර්ධනය වන ළමා පරපුරේ අවශ්‍යතා, පැවැත්ම හා රැකවරණය තහවුරු කිරීම වෙනුවෙන් නිර්මාණය වන ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණ සඳහා පුළුල් කාර්යභාර්යක් මේ අනුව ඔවුන්ගේ විෂය පථයන්ට පැවරේ.

## ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයන්හි ක්‍රියාකාරීත්වය

ශ්‍රී ලංකාව තුළ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය සම්මත කොට ක්‍රියාත්මක කිරීමෙන් පසු ඒත් සමගම ළමා අයිතිවාසිකම් ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබූ අතර ඒවා සමාජයේ ඉහළ සිට පහළට විහිදී යන ආකාරයෙන් ප්‍රායෝගිකව ක්‍රියාවේ යෙදවීමට පියවර ගනු ලැබීය (ඒකනායක, 1998: 29). මේ අනුව ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම සිදු කරයි. එය කමිටු 6 ක් හරහා සිදු කරනු ලැබේ. එනම් ජාතික මෙහෙයුම් කමිටුව, පළාත් මෙහෙයුම් කමිටුව, දිස්ත්‍රික්ක මෙහෙයුම් කමිටුව, ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව සහ ග්‍රාමීය මෙහෙයුම් කමිටුව වශයෙන් එම කමිටු වේ (සිතුවම සංවර්ධන අධ්‍යාපන හා පුහුණු සංවිධානය, 2000: 33). මෙම කමිටු ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ජාතික ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාවේ යොදවන අතර 1991 සිට 1995 අතර කාලය තුළ ඒ සඳහා පස් අවුරුදු සැලසුම් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවා තිබේ. ජාතික මෙහෙයුම් කමිටු අධීක්ෂණය මත සෙසු කමිටු පවතී. දිස්ත්‍රික්ක මෙහෙයුම් කමිටුව රාජ්‍යය අංශයේ සෞඛ්‍යය, අධ්‍යාපන සහ පොලිස් ආදි ආයතනවල ඉහළ නිලධාරීන්ගෙන් සමන්විත වන අතර ළමා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින රාජ්‍යය නොවන සංවිධාන ද, මෙම කමිටුව නියෝජනය කරයි. ළමයින් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාවේ යෙදවීම මෙහි ප්‍රධාන කර්තව්‍යය වේ (ඒකනායක, 1998: 37). එසේම ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව ළමා සුභසාධනය හා ආරක්ෂණය සම්බන්ධව කටයුතු ග්‍රාමීය මට්ටම දක්වා ගෙන යමින් ග්‍රාමීය ප්‍රජාව බලාත්මක කරමින් වඩාත් යෝග්‍යය සුභසාධන කටයුතු සිදු කිරීම හරහා ප්‍රාදේශීයව ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනයට ක්‍රියා කරනු ලැබේ. ඒ අනුව ප්‍රාදේශීයව ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම, ප්‍රඥප්තියේ සඳහන් කාරණා සංශෝධන අවශ්‍යනම් දිස්ත්‍රික්ක මෙහෙයුම් කමිටුවට වාර්තා කිරීම, ළමා සුභසාධනය සහ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අවශ්‍ය යෝජනා දිස්ත්‍රික්ක කමිටුවට ගෙන යාම සිදු කරයි (සිතුවම සංවර්ධන අධ්‍යාපන හා පුහුණු සංවිධානය, 2000: 30).

එසේම පරිවාස හා ළමා රැකවරණ සේවා දෙපාර්තුමේන්තුව ද, විවිධාකාරයෙන් ළමයින් සම්බන්ධව ක්‍රියාකාරීව ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට මැදිහත් වේ. මේ අනුව 2014 වර්ෂය වන විට ළමා අයිතිවාසිකම් සම්බන්ධව ක්‍රියාකාරී කාර්භාර්යයක් ඉටු කර ඇති අතර ඊට අදාළව ක්‍රියාත්මක වී තිබේ. එය පහත වගු සටහන පරිදි වේ.


වගු අංක 02: 2014 වර්ෂය තුළ පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්තුමේන්තුවට ලැබුණු පැමිණිල සහ ඊට අදාළව ගත් ක්‍රියාමාර්ග

| පැමිණිල්ලේ ස්වභාවය | ලද පැමිණිලි සංඛ්‍යාව | විසඳුම්/ නීතිමය සහන ලබා දුන් පැමිණිලි | වෙනත් ආයතන වෙත යොමු කිරීම |
|---|---|---|---|
| පාසැල් නොයැවීම | 2665 | 2092 | 573 |
| ලිංගික අපයෝජනය | 328 | 139 | 189 |
| කායික අපයෝජනය | 225 | 149 | 76 |
| බාල වයස් විවාහ | 207 | 88 | 119 |
| නොසළකා හැරීම් | 1924 | 1524 | 400 |
| **එකතුව** | 5349 | 3992 | 1357 |

මූලාශ්‍රයඃ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්මේන්තු කාර්ය සාධන වාර්තාව, 2014

එමෙන්ම මෙම ආයතනය තුළින් ළමා සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා ජාතික ළමා සභාව, දිස්ත්‍රික්ක ළමා සභාව, ප්‍රාදේශීය ළමා සභාව සහ ළමා සමාජ වශයෙන් ඉහළ සිට පහළට යාන්ත්‍රණයක් සකස් කර තිබේ. එසේම දරුවන් හදාවඩා ගැනීමට දීම, පරිවාස කටයුතු මෙමඟින් දියත් කරනු ලැබේ (පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්මේන්තු කාර්ය සාධන වාර්තාව, 2014: 22). ඒ අනුව ජාතික මට්ටමේ සිට බිම් මට්ටමේ ළමා සමාජ දක්වා ගොඩනගා ඇති ළමා සහභාගීත්ව යාන්ත්‍රණයේ ව්‍යුහය පහත රූප සටහන 01 පරිදි වේ.

රූප සටහන 01: පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තුමේන්තුව විසින් ජාතික මට්ටමේ සිට ළමා සමාජ දක්වා ගොඩනගා ඇති ළමා සහභාගීත්ව යාන්ත්‍රණයේ ව්‍යුහය




මූලාශ්‍රයඃ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යංශ වාර්ෂික වාර්තාව, 2015

ළමා අපයෝජන සම්බන්ධයෙන් වන අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ සොයා බලන ප්‍රධාන යාන්ත්‍රණය වන්නේ ජාතික ළමා රක්ෂණ අධිකාරිය වේ. එයට පැමිණිලි ලැබෙන ආකාර කිහිපයකි. එනම් 1929 ළමා දුරකථන සේවාව හරහා ද, වාචිකව සහ ලිපි මගින් ද, පැමිණිලි වාර්තා වේ. ඒ අනුව 2013 වර්ෂයේ දී, ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි 10273 වාර්තා වී ඇති අතර වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ළමා හිංසනය සම්බන්ධවයි. එනම්, පැමිණිලි 2030 කි. අනිවාර්ය අධ්‍යාපනය නොදීම පිළිබඳ පැමිණිලි 1263 ක් ද, ස්ත්‍රී දූෂණයට අදාළ පැමිණිලි 691 ක් ද, නොසලකා හැරීම් පිළිබඳ පැමිණිලි 1101 ක් ද, ලිංගික අපයෝජනයට අදාළ පැමිණිලි 681 ක් ද, සහ

ලිංගික හිරිහැර කිරීම් පිළිබඳ පැමිණිලි 400 ක් ද, ලැබී තිබේ. කඩිනමින් මේ පැමිණිලි සඳහා ක්‍රියාත්මක වෙමින් හරි අඩකට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා අදාළ පියවර ගෙන තිබේ (ජාතික ළමාරක්ෂණ අධිකාරී වාර්ෂික වාර්තාව, 2013). ළමා මෙහෙකාර සේවයට අදාළ පැමිණිලි ඊට අදාළ නීති සහ ක්‍රියාමාර්ග ගනු ලබන්නේ කම්කරු දෙපාර්තුමේන්තුවේ කාන්තා සහ ළමා කටයුතු අංශය මගිනි. ඒ අනුව 2014 වසර තුළ කම්කරු දෙපාර්තුමේන්තුවේ කාන්තා සහ ළමා කටයුතු අංශයට ලැබුණු පැමිණිලි හා ගත් ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

වගු සටහන 03: 2014 වර්ෂයේ ළමා මෙහෙකාර සේවය පිළිබඳ පැමිණිලි සහ පරීක්ෂණ

| **දෙපාර්තුමේන්තුවට ලැබුණු පැමිණිලි** | **232** |
|---|---|
| නීතිමය පියවර ගෙන අවසන් කර ඇති සංඛ්‍යාව | 01 |
| නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් සිටින සංඛ්‍යාව | 04 |
| ළමා සේවයක් අනාවරණය නොවූ සංඛ්‍යාව | 108 |
| විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | 119 |

මූලාශ්‍රය: කම්කරු දෙපාර්තුමේන්තු කාන්තා හා ළමා කටයුතු අංශය වාර්ෂික වාර්තාව, 2014

එමෙන්ම ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය ළමයින් වෙනුවෙන් ළමා සුභසාධන කටයුතු සඳහා පුළුල් වැඩ පිළිවෙලක් දියත් කරනු ලැබේ. ඒ අනුව ළමයින්ගේ ආරක්ෂාව සහ යහපත මුල් කර ගනිමින් විවිධ මධ්‍යස්ථාන පවත්වා ගෙන යනු ලැබේ. ඒ අතරින් "සුරැකි පියස" ළමා සුරැකුම් මධ්‍යස්ථානයට ප්‍රධාන තැනක් හිමි වේ. වින්දිත ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂණ අධිකාරී පනතේ 14 (ඉ) සහ (ඒ) වගන්ති ප්‍රකාරව කටයුතු කරමින් ඔවුනගේ රැකවරණය වෙනුවෙන් වෙනම ස්ථානයක් ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙහිදී වින්දිත දරුවන් සුරක්ෂිතව තබා ගනිමින්, ඔවුන්ගේ අයිතීන් උපරිමයෙන් ආරක්ෂා කර දෙමින්, ඔවුන්ට මනෝසමාජීය සහය ලබා දෙමින් සහ ඔවුන්ගේ මානසික මට්ටම් යහපත් කරමින් මනා පෞරුෂයකින් හෙබි දරුවන් සමාජ ගත කිරීමේ පදනම සකස් කරනු ලබයි. ඒ අනුව මෙම සුරැකි පියස ළමා මධ්‍යස්ථානය යටතේ 2012 වර්ෂයේ දී ළමුන් 88 දෙනෙකුට ද සහ 2013 වර්ෂයේ දී ළමයින් 95 දෙනෙකුට රැකවරණය සපයා ඇත (ජාතික ළමා ආරක්ෂණ අධිකාරි කාර්ය සාධන වාර්තාව, 2013: 56).

එසේම පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තුමේන්තුව ද ළමා සුභසාධනය ආශ්‍රිතව කටයුතු රැසක් සිදු කරනු ලැබේ. ඒ අතරින් පාසල් නොයන ළමුන් පාසල් යැවීම මුල් කර ගනිමින් ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් සිදු කරනු ලැබේ. ඒ අනුව පාසල් නොයන වයසේ පසු වුවන් ආර්ථික දුෂ්කරතා මත අධ්‍යාපනය නවතා දමා ඇති හෝ විවිධ හේතූන් මත කඩින් කඩ පාසල් යන දරුවන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගෙන ඒ සඳහා බලපාන හේතු සොයා ඔවුන් පාසල් ගත කිරීමත් සහ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ අනුව වතු ආශ්‍රිත ළමයින්ගේ අධ්‍යාපනය නගා සිටු වීම සඳහා පාසල් උපකරණ ආදිය ලබා දීම මේ හරහා සිදු කරනු ලැබේ (පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තුමේන්තු කාර්ය සාධන වාර්තාව, 2014: 50). සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය, කැපකරු දෙගුරු වැඩසටහන සහ නැණ දිරිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය යනාදිය හරහා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වර්ධනය සඳහා මූල්‍යමය උපකාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදු කරනු ලැබේ. තෝරා ගත් දරුවන් පිරිසක් වෙත මාසිකව රුපියල් 500 ක් හෝ රුපියල් 750ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිටින පරිවාස නිලධාරීන්ගේ මාර්ගයෙන් ගෙවනු ලැබේ (පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තුමේන්තු කාර්ය සාධන වාර්තාව, 2014: 53).

ළමා ලේකම් කාර්යාලය හරහා ද මුල් ළමා විය සුභසාධන කටයුතු ක්‍රියාවට නංවනු ලැබේ. ඒ අනුව මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංවර්ධනය කරමින් ඊට අදාළ ප්‍රමිතීන් තීරණය කර එම මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම ළමා ලේකම් කාර්යාලය හරහා සිදු කරයි. එසේම දිවයිනේ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තෝරා ගන්නා ලද ගම්මානයක් මුල් ළමා

විය ආදර්ශ ගම්මානයක් බවට පත් කරමින් එහි පවතින පෙර පාසැල් "ආදර්ශ පෙර පාසල්" වශයෙන් සංවර්ධනය කරමින් අදාල ප්‍රදේශයේ පොලිස් ස්ථානය ළමා මිතුරු ස්ථානයක් වශයෙන් වර්ධනය කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මේ හරහා සිදු කරනු ලැබේ. මීට අමතරව පෝෂණ මංපෙත නමින් මුල් ළමා වියේ දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා වර්ධනය කිරීම සඳහා දියත් කරනු ලැබේ (ළමා හා කාන්තා කටයුතු අමාත්‍යංශ වාර්ෂික වාර්තාව, 2015: 67). මෙම යාන්ත්‍රණ ඔස්සේ ළමා අයිතිවාසිකම් වෙනුවෙන් ප්‍රධාන කාර්යභාර්යක් ඉටු කරනු ලැබුව ද, 1977 වර්ෂයේ දී, හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකාව සමස්ත ලොකයට ම, විවර වීම සමග සංචාරක ව්‍යාපාරය සහ තරඟකාරී ජීවන රටාව තුළ ළමා ලිංගික අපයෝජන, ළමා ගණිකා වෘත්තිය, විදේශිකයින්ට ළමයින් විකිණීම ආදිය වර්ධනය විය. විශේෂයෙන් මීගමුව මුහුදු තීරයේ "බීච් බෝයිස්" සහ "බීච් ගර්ල්ස්" නමින් ළමා ගණිකා වෘත්තිය වර්ධනය වී තිබේ (සමරකෝන්, 2007: 42). මත් ද්‍රව්‍ය බෙදා හැරීමට යොදා ගැනීම, දූෂණය කර මරා දැමීම සහ සිවිල් යුද්ධ සහ ආපදා නිසා අකාලයේ මිය යාම හා අනාථ වීම ආදිය මේවන විටත් ශ්‍රී ලාංකීය සමාජ රටාව තුළ ළමයින්ට එරෙහිව වර්ධනය වී තිබේ. මේ නිසා රාජ්‍යය නීතිමය යාන්ත්‍රණ තිබියදීත් අවතැන් වෙමින් දෙමාපිය රැකවරණය අහිමි අසරණ හා හිංසනයට ගොදුරු වූ ළමයින් වෙනුවෙන් අනාථ කඳවුරු, ළමා නිවාස සහ ළමා ගම්මාන විශාල වශයෙන් වර්ධනය වෙමින් පවතී (කුරේ, 2005: 33).

## නිගමනය

ශ්‍රී ලංකා රජය විසින් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය සඳහා නීති, අණපනත් සහ ප්‍රඥප්ති ස්ථාපිත කොට තිබේ. නමුත් මේවා තුළින් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී ඇතිවන්නා වූ ප්‍රායෝගික බාධාවන් නිසා මේවා හුදෙක් නීති, ප්‍රඥප්ති සහ ප්‍රතිපත්තිවලට පමණක් සීමා වී තිබේ. එසේම ජාතික සහ පහළ මට්ටමේ කමිටු ආදිය සඳහා ළමා සහභාගිත්වය නිශ්චිත ලෙස යොදා නොගැනීම සහ එම කමිටුවල දුර්වලතා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය මන්දගාමී කොට ඇත. එමෙන්ම රාජ්‍යය සහ රාජ්‍යය නොවන සංවිධානවල සහය අවශ්‍ය තරමට යොදා නොගැනීමත් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමෙන් ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම් සිදු නොකිරීම හරහා ළමා අයිතිවාසිකම්වල ප්‍රමාණාත්මක ප්‍රවර්ධනයක් ද, සිදු නොවේ. මේ නිසා ළමා අයිතිවාසිකම් ගොඩනැඟීමට යාන්ත්‍රණයන් හා නෛතික රාමුවක් ගොඩනගා තිබුණ ද, ඒ පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය අවම වී තිබේ. එමෙන්ම ග්‍රාමීය මට්ටමෙන් සිදුවන ළමා අයිතිවාසිකම් උල්ලංඝණයවීම් සහ ගෘහ ඒකක තුළ සිදුවන ළමා අයිතිවාසිකම් උල්ලංඝණවීම් අදාළ ආයතනවලට වාර්තා වීමක් සිදු නොවන අතර වාර්තා වන සිදුවීම් සඳහා ද, අදාළ අංශ ක්‍රියාත්මකවීම දුර්වල මට්ටමක පවතී. මේ නිසා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සමහර ආයතන පිළිබඳ ජනතාවගේ විශ්වාසනීයත්වය පළුදු වී යාම සිදු වී තිබේ. කෙසේ නමුත් පොදුවේ ගත් විට ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් පිළිබඳ වගකිව යුතු අංශ සහ යාන්ත්‍රණවල අවධානය අඩු වී යාම මේ වන විට දක්නට ලැබෙන පොදු ගැටලුවකි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ජයසුන්දර, ලාල්., (2009). *ළමා අයිතිවාසිකම් හා නෛතික ප්‍රතිපාදන*, කතෘ ප්‍රකාශන.

මානව හිමිකම් සංවර්ධනය පිළිබඳ නීතිවේදී සංවිධානය., (2000). *ළමා අපයෝජනය සහ නීතිය*, කොළඹ: මානව හිමිකම් සංවර්ධනය පිළිබඳ නීතිවේදී සංවිධානය, ළමා අංශය.

වන්නිආරච්චි, ජේ.සී., (2003). *මව්පිය දරු වගකීම් සහ ළමා අයිතිවාසිකම්*, එස් ගොඩගේ සහෝදරයෝ.

සමරකෝන්, සී., (2007). *ළමා අයිතිවාසිකම් සරලව*. මහරගම: තරංජී ප්‍රින්ටර්ස්.

සිතුවම සංවර්ධන අධ්‍යාපන හා පුහුණු සංවිධානය., (2000). *ළමා අයිතිවාසිකම් උල්ලංඝණයවීම්*, කොළඹ : සිතුවම සංවර්ධන අධ්‍යාපන හා පුහුණු සංවිධානයේ ප්‍රකාශන.

Grime, J. M., (2000). *Children in between: Child rights and child placement in Sri Lanka*. University of Warwick

Jayathilake, R., & Amarasuriya, H. (2005). *Home truths: Children's rights in institutional care in Sri Lanka: Full report*, Colomboඃ Save the Children in Sri Lanka.

M, D. L., (1981). Princes in all the earth: *A study of children in society and their rights in Sri Lanka*, Kandyඃ De Lanerolle.